## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල් අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමට අදාලව විධිමත් ඉ-ඉගෙනුම් රාමුවක් හඳුන්වා දීම සඳහා ජාතික ඉ-ඉගෙනුම් වැඩසටහනක් සංවර්ධනය කිරීමට සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අධ්‍යාපනය සඳහා වූ විස්තීර්ණ වැඩසටහනක් ස්ථාපිත කිරීමට කොරියානු EXIM බැංකුවේ මූල්‍ය ආධාර සහිතව ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි. "ද්විතියික අධ්‍යාපනය සඳහා ICT මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (GOSL/EDCP)-SRI-31" යන ව්‍යාපෘතිය යටතේ මාස 27 ක කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ:

| තනතුර | වැටුප් පරිමාණය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | A | 1 |
| ප්‍රසම්පාදන විශේෂඥ | C | 1 |
| මුදල් කළමනාකරු | C-I | 1 |
| ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | D | 1 |
| ව්‍යාපෘති නිලධාරී | F | 1 |
| තාක්ෂණික නිලධාරී | F | 1 |
| ව්‍යාපෘති කළමනාකරණ සහකාර | 02/2026 (3:2:3) කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව | 3 |
| කාර්යාල සහකාර | | 1 |
| රියදුරු | | 1 |

**සියලුම තනතුරු සඳහා වන පොදු කොන්දේසි**

1. සුදුසුකම් සහ අයදුම්පත්: https://moe.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.
2. වැටුප: 2026 මාර්තු 28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ගෙවීම් කරනු ලැබේ.
3. සේවා කොන්දේසි:

   අ. ව්‍යාපෘති අවශ්‍යතා සහ කාර්යසාධනය මත පදනම්ව දීර්ඝ කිරීමට යටත්ව, මාස 27 ක කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් සිදු කරනු ලැබේ.

   ආ. රාජ්‍ය නිලධාරීන් පහත පරිදි බඳවා ගනු ලැබේ:

   - ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා: පූර්ණ කාලීන මුදාහැරීමේ පදනම මත.
   - අනෙකුත් තනතුරු සඳහා: කොන්ත්‍රාත් කොන්දේසි යටතේ ඔවුන්ගේ නිත්‍ය සේවයට බාහිරව අනුයුක්ත කිරීමේ පදනම මත.

   ඇ. සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

   ඈ. අයදුම්කරුවන් තම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද පිළිබඳ සහතික හි සහතික කළ පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු සමගින් සිය ජීව දත්ත පත්‍රිකාව ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2026 අගෝස්තු 29** වන දින **පස්වරු 3:00** ට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට යැවිය යුතුය: ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල

ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "**ද්විතියික අධ්‍යාපනය සඳහා ICT මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**" යන ව්‍යාපෘති නාමය සහ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,**
**ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED